سنهالي

වැදගත් පාඩම් මාලාව

කර්තෘ

අබ්දුල් අzසීස් බින් අබ්දුල්ලාහ් බින් බාzස්

අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!



Islamhouse.com

المحتوى الإسلامي

වැදගත් පාඩම් මාලාව

සාමාන්‍ය ජනයා සඳහා

කර්තෘ අෂ්-ෂෙයික්

අබ්දුල් අZසීස් බින් අබ්දුල්ලාහ් බින් බාZස්

(අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!)

ح جمعية الدعوة و الارشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٥ هـ
فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

بن باز : عبدالعزيز بن
الدروس المهمة لعامة الأمة - سنهالي. / عبدالعزيز بن بن باز
-ط.١.- الرياض ، ١٤٤٥

٤٨ ص ؛ ١٤ × ٢١ سم

ردمك: ١-٠٤-٨٤١٧-٦٠٣-٩٧٨

١- الاسلام - مبادئ عامة أ.العنوان

ديوي ٢١١ ١٤٤٥ / ٢٣٧١

دار الإسلام جمعية الربوة رواد الترجمة

- قامت جمعية الدعوة والإرشاد بالربوة بمراجعة وتصميم هذا الإصدار.
- تتيح الجمعية طباعة الإصدار ونشره بأي وسيلة مع الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص.
- في حالة الطباعة يجب الالتزام بمعايير الجودة التي اعتمدتها الجمعية.

Telephone: +966114454900
Fax: +966114970126
P.O.BOX: 29465
RIYADH: 11557
ceo@rabwah.sa
www.islamhouse.com

පෙරවදන

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

සියලු ප්‍රශංසා සියලු ලෝකයන්හි පරමාධිපති අල්ලාහ් සතු ය. තව ද අපගේ නබිනායක මුහම්මද්තුමාණන් කෙරෙහිත් එතුමාණන්ගේ පවුලේ උදවිය හා එතුමාණන්ගේ මිතුරන් යන සියලු දෙනා කෙරෙහිත් අල්ලාහ් දෙවිඳාණෝගේ ශාන්තිය හා සමාදානය උදා වේවා!

මෙසේ ප්‍රාර්ථනා කිරීමෙන් පසු...

මෙය සාමාන්‍ය ජනයා ඉස්ලාමය පිළිබඳ අනිවාර්යයෙන් ම දැනගත යුතු කරුණු කිහිපයක කෙටි පැහැදිලි කිරීමකි. මම එය,"සෑම මුස්ලිම්වරයෙකුට ම වැදගත් පාඩම් මාලාව" ලෙස නම් කළෙමි.

මෙම කෘතිය මුස්ලිම්වරුන්ට ප්‍රයෝජනවත් කෘතියක් ලෙස පත් කරන මෙන් හා මාගේ මෙම කර්තව්‍යය පිළිගන්නා මෙන් අල්ලාහ් දෙවිඳාණන්ගෙන් මම ප්‍රාර්ථනා කරමි. සැබැවින් ම ඔහු ත්‍යාගශීලී හා මහා පරිත්‍යාගශීලී ය.

අබ්දුල් අ^zසීස් බින් අබ්දුල්ලාහ් බින් බා^zස්

පළමු පාඩම

සූරා අල්-ෆාතිහා සහ කෙටි සූරා කිහිපයක්

සූරා අල්-ෆාතිහා සහ සූරා අZස්Zසල්Zසලා සිට සූරා අන්නාස් දක්වා ඇති කෙටි සූරා කිහිපය මනා ලෙස කියවීම මෙන් ම, අවබෝධ කරගත යුතු අනිවාර්ය කරුණු විස්තරාත්මක ව දැනගැනීම හා වනපොත් කරගැනීම.

***

දෙවන පාඩම

ඉස්ලාමයේ මූලිකාංග

ඉස්ලාමයේ මූලිකාංග පහ විස්තර කිරීම. එයින් පළමු හා උසස් ම මූලිකාංගය වන්නේ නැමදීමට සුදුස්සා අල්ලාහ් දෙවිඳාණෝ හැර වෙනත් කෙනෙකු නොමැත ලෙසත්, මුහම්මද්තුමා අල්ලාහ්ගේ දූතයා ලෙසත්, ඊට අදාළ කොන්දේසි හා පැහැදිලි කිරීම් සමඟ සාක්ෂි දැරීම වේ.

"ලා ඉලාහ" යනු අල්ලාහ් හැර නමදිනු ලබන අනෙකුත් සියලු දෑ ප්‍රතික්ෂේප කිරීම වේ. "ඉල්ලල්ලාහ්" යනු නැමදුම් සියල්ල කිසිදු ආදේශකයෙකු නොමැති ඒකීය අල්ලාහ්ට පමණක් හිමි බව තහවුරු කිරීම වේ. "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" යන්නෙහි කොන්දේසි වූ කලී, අනාවබෝධයෙන් තොර පරිපූර්ණ දැනුම, කිසිදු සැකයක් නොමැති ස්ථාවර භාවය, ආදේශයෙන් තොර පිවිතුරු චේතනාව, අසත්‍යයෙන් තොර සත්‍යය, පිළිකුලෙන් තොර ආදරය, ආදේශයෙන් තොර අවනත භාවය, ප්‍රතිකෂේපයෙන් තොර ව පිළිගැනීම හා අල්ලාහ් හැර නමදිනු ලබන සියල්ල ප්‍රතික්ෂේප කිරීම වේ. මෙම කොන්දේසිය පහත සඳහන් අරාබි කවියක පරිවර්තනයෙහි පැහැදිලි කර ඇත.

දැනුම, ස්ථාවරත්වය, පිවිතුරු චේතනාව, ආදරය මුසු වූ සත්‍යවන්ත භාවය, අවනත භාවය හා පිළිගැනීම අටවන

කරුණු ලෙස අල්ලාහ් හැර දේවත්වයට පාත්‍ර කරන ලද සියල්ල ප්‍රතික්ෂේප කිරීම එකතු කරන ලදී.

මුහම්මද්තුමා අල්ලාහ්ගේ දූතයා ලෙස සාක්ෂි දැරීම යනු එතුමාණන් පැවසූ සියල්ල සත්‍ය යැයි විශ්වාස කිරීම, එතුමාණන් අණට කීකරු වීම, එතුමාණන් වැලැක්වූ කරුණුවලින් ඉවත් ව සිටීම හා අල්ලාහ් හා එතුමාණන්ගේ දූතයා අනුමත කළ අයුරින් පමණක් අල්ලාහ් නැමදීම වේ. පසු ව ඉතිරි ඉස්ලාමයේ මූලිකාංග සිසුවාට පැහැදිලි කර දීම. ඒවා නම් සලාතය, Zසකාතය, රමළාන් උපවාස ශීලය හා ඇති හැකි උදවිය හජ් වන්දනාවේ නියැලීම වේ.

***

තෙවන පාඩම

ඊමානයේ මූලිකාංග

ඊමානයේ මූලිකාංග හයකි. ඒවා නම්, අල්ලාහ් දෙවිඳාණෝ, එතුමාණන්ගේ පුස්තක, දූතයන් හා අවසන් දිනය කෙරෙහි විශ්වාස කිරීම හා යහපත අයහපත සියල්ල අල්ලාහ්ගෙන් ම සිදු වන බව විශ්වාස කිරීම වේ.

***

සිව්වන පාඩම

තව්හීද්හි හා ෂිර්ක් හි කොටස්

තව්හීද්හි කොටස් පැහැදිලි කිරීම. තව්හීද්හි කොටස් තුනකි. තව්හීද් අර් රුබූබියියාහ්, තව්හීද් අල් උලුව්හියියාහ්, තව්හීද් අල් අස්මා වස්සිෆාත්.

තව්හීද් අර් රුබූබියියාහ් යනු සියල්ලෙහි මැවුම්කරු හා සියල්ල හසුරුවන්නා අල්ලාහ් දෙවිඳාණෝ යැයි සහ ඒ කිසිවක් තුළ අල්ලාහ් දෙවිඳාණෝ හට කිසිදු සහකරුවෙකු නොමැති බවට තරයේ විශ්වාස කිරීම වේ.

තව්හීද් අල් උලුව්හියියාහ් යනු "නැමදීමට සුදුස්සා අල්ලාහ් දෙවිඳාණෝ බවට සහ ඒ කාර්යයෙහි ඔහුට කිසිදු සහකරුවෙකු නොමැති බවට තරයේ විශ්වාස කිරීම" වේ. එනම් "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" යන්නෙහි අර්ථය වේ. එහි අර්ථය නම් "නැමදීමට සුදුස්සා අල්ලාහ් දෙවිඳාණෝ හැර වෙනත් කිසිවෙකු නොමැත. එමෙන් ම සලාතය, සව්මය යනාදී සියලු ම නැමඳුම් කටයුතු අල්ලාහ් දෙවිඳාණෝගේ තෘප්තිය උදෙසා පමණක් සිදු විය යුතු අතර, ඒවායින් කිසිවක් වෙනත් කෙනෙකු හෝ දෙයක් උදෙසා සිදු නො විය යුතු ය" යන්න වේ.

තව්හීද් අල් අස්මා වස්සිෆාත් යනු "උතුම් අල් කුර්ආනයේ හා නිවැරදි හදීස්වල සඳහන් අල්ලාහ් දෙවිඳාණෝගේ අලංකාර නාම හා ගුණාංග පිළිබඳ

තරයේ විශ්වාස කිරීම මෙන් ම, ඒවා කිසිදු විකෘති කිරීමක්, ප්‍රතික්ෂේප කිරීමක් හා ඒවා කෙසේ ද යන්න විස්තර කිරීමෙකින් ද ඒවාට උපමා කිරීමකින් ද තොර ව, ඒවා අල්ලාහ්ට ම සරිලන අයුරින් ඔහුට ම හිමි බවට තහවුරු කිරීම" වේ. මෙයට පහත උතුම් කුර්ආනීය වැකි සාධකයක් වේ. "(නබිතුමනි) ඔබ (ඔවුනට) පවසන්න. අල්ලාහ්, ඔහු ඒකීය වේ. ඔහු සියලු අවශ්‍යතාවලින් තොර මෙන් ම (මැවීම් විසින් නිරතුරුව ම) පතනු ලබන්නා ය. ඔහු කිසිවෙකු බිහි නො කළේ ය. ඔහු (කිසිදු දෙමව්පියෙකුට) උපත ලැබුවේ ද නැත. ඔහුට සමාන කිසිවෙකුත් නොමැත."(අවශ්‍යතාවලින් තොර යනු : සම්පූර්ණයෙන් ම අවශ්‍යතාවලින් තොර යන්නයි) තවද අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ ද පවසති. ඔහු වැනි කිසිවකුත් නොමැත. තව ද ඔහු සර්ව ශ්‍රාවක හා සර්ව නිරීක්ෂක වේ. (අෂ් ෂූරා : 11)

සමහර ඉස්ලාමීය වියතුන් මෙම තව්හීදය කොටස් දෙකකට බෙදා දක්වා ඇත. එනම් තව්හීද් අල් අස්මා වස්සිෆාත් යන සංකල්පය තව්හීද් අර් රුබූබියියා තුළ අන්තර්ගත කිරීම වේ. නමුත් එම කොටස් දෙකෙන් ම තව්හීද්හි විස්තර පැහැදිලි වන හෙයින් කිසිදු ගැටලුවක් නොමැත.

ෂිර්ක්හි කොටස් තුනකි. ඒවා නම්, ෂිර්කුල් අක්බර් (මහා ෂිර්ක්), ෂිර්කුල් අස්ගර් (සුළු ෂිර්ක්) හා ෂිර්කුල් කෆී (සැඟවුණු ෂිර්ක්) වේ.

ෂිර්කුල් අක්බර් යනු "(කවරෙකු එම ක්‍රියාවේ යෙදෙන්නේ ද ඔහුගේ) යහක්‍රියා සියල්ල ප්‍රතික්ෂේප වීම හා (අල්ලාහ්ගෙන් පාපක්ෂමාවෙහි (තව්බාවෙහි) නො යෙදී) එම ක්‍රියාවෙහි ම නියැලෙමින් සිටින තත්ත්වයෙන් මරණයට පත් වූ පුද්ගලයා අපායේ සදාතනික ව සිටීම අනිවාර්ය කරන්නකි. අල්ලාහ් දෙවිඳාණෝ මෙලෙස ප්‍රකාශ කරති. "ඔවුන් අල්ලාහ් කෙරෙහි ආදේශ තබන්නේ නම් ඔවුන් කරමින් සිටි සියලු ම ක්‍රියා නිශ්ඵල වී යන්නේ ම ය. " (සූරා අල්අන්ආම්: 88) තව ද අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ ද පවසයි. "කුෆ්රයට එනම් ප්‍රතික්ෂේප කිරීමට සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටින මුෂ්රික් එනම් ආදේශ තබන්නන්ට අල්ලාහ්ගේ මස්ජිදයන් පරිපාලනය කිරීමට කිසිදු අයිතියක් නොමැත. ඔවුහු කවරෙහු ද යත් තමන්ගේ ක්‍රියා නිශ්ඵල කරගත් හා සදාතනික ව ම අපායේ වාසය කරන්නෝ වෙති." (සූරා අත්තව්බා: 17)

කවරෙකු එම ක්‍රියාවෙහි නියැලෙමින් සිටිය දී මරණයට පත් වන්නේ ද ඔහුට ස්වර්ගය හරාම් වේ. අල්ලාහ් දෙවිඳාණෝ මෙසේ දේශනා කරති."සැබැවින් ම අල්ලාහ් තමන් කෙරෙහි ආදේශ තබන උදවියට

කිසිසේත් ම පාපක්ෂමාව ලබා නොදෙන අතර ඒ හැර අනෙකුත් පාපයන්හි නියැළෙන උදවිය අතුරින් අල්ලාහ් කැමති කෙනෙකුට සමාව ලබා දෙයි."(සූරා අන්නිසා: 48) තවද අල්ලාහ් මෙසේ ද පවසයි. "කවරෙකු අල්ලාහ් කෙරෙහි ආදේශ තබන්නේ ද නියත වශයෙන් ම අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කරන්නේ ය. එසේ කරන්නාගේ නවාතැන වන්නේ අපාය යි. අපාරාධකරුවන්ට පිහිට වන්නන් කිසිවෙකුත් නොමැත."(සූරා අල්මාඉදා: 72)

මෙයට උදාහරණ වනුයේ: මරණයට පත් වූවන්ගෙන් හා පිළිමවලින් ප්‍රාර්ථනා කිරීම, උදව් පැතීම, ඔවුනට බාර වීම හා ඔවුන්ගේ නාමයෙන් සත්ත්වයින් ඝාතනය කිරීම යනාදී දේවල් ය.

ෂිර්කුල් අස්ගර් යනු උතුම් අල් කුරානයේ හෝ සුන්නාවෙහි ෂිර්ක් යැයි සඳහන් වූවකි. නමුත් එය ෂිර්කුල් අක්බර් නො වේ. මෙයට නිදසුන් ලෙස මූනිච්චාවට කරන සමහර ක්‍රියා, අල්ලාහ් හැර වෙනත් දෑ මත දිව්රීම මෙන් ම "අල්ලාහ්ගේ සහ යම් කෙනෙකුගේ අභිමතය පරිදි" යන ප්‍රකාශය යනාදිය සඳහන් කළ හැකි ය. දේව දූත මුහම්මද්තුමාණෝ මෙසේ පැවසූහ: "ඔබලා කෙරෙහි මා බිය වන, ඉතා බියකරු ම කරුණ වන්නේ ෂිර්කුල් අස්ගර් වේ. එවිට එතුමාණන්ගෙන් ඒ කුමක් දැයි විමසන ලදී. එයට එතුමාණෝ පහත සඳහන් අයුරින්

පැවසූහ :මූනිච්චාව" ඉමාම් අහ්මද්, තබරානි හා අල්බයිහකී යන විද්වත්හු මෙම හදීසයේ නිවැරදි නාමාවලියක් යටතේ තම ග්‍රන්ථවල සඳහන් කොට ඇත්තෝ ය.

දේව දූත මුහම්මද්තුමාණෝ මෙසේ පැවසූහ. "කවරෙකු අල්ලාහ් හැර වෙනත් දෙයක් මත දිවුරන්නේ ද ඔහු අල්ලාහ්ට ආදේශ තැබූවේ ය. " ඉමාම් අහ්මද්තුමා මෙම හදීසය හසන් (පිළිගත හැකි) ගණයට අයත් හදීසයක් ලෙස තම මුස්නද් අහ්මද් ග්‍රන්තයේ සඳහන් කරයි. අබූදාවුද් හා තිර්මිදිතුමා නිවැරදි නාමාවලියකට අනුව උමර් (රළි) තුමා වාර්තා කරන පහත හදීසය වාර්තා කරති. "කවරෙකු අල්ලාහ් හැර වෙනත් දෙයක් මත දිවුරන්නේ ද ඔහු අල්ලාහ් ප්‍රතික්ෂේප කළේ ය. එසේ නොමැති නම් ඔහු අල්ලාහ්ට ආදේශ තැබුවේ ය. "

දේව දූත මුහම්මද්තුමාණෝ මෙසේ පැවසූහ. "අල්ලාහ්ගේ අභිමතය හා යමෙකුගේ අභිමතය පරිදි (මෙය සිදු විය) යැයි නො පවසන්න. පළමුව අල්ලාහ්ගේ අභිමතය පරිදි හා පසු ව තවත් යමෙකුගේ අභිමතය පරිදි (මෙය සිදු විය) යනුවෙන් ම පවසන්න." මෙය අබූ දාවුද්තුමා හුදෙයිෆා බින් අල්යමානිතුමාගේ මාර්ගයෙන් නිවැරදි හදීසයක් ලෙස තම ග්‍රන්ථයේ සඳහන් කර ඇත.

මෙම වර්ගය දහමෙන් බැහැර කරවන හා සදාතනික ව අපා ගත වීමේ තත්ත්වයක් ඇති නො කරයි. නමුත් එය

අනිවාර්යයෙන් ම විශ්වාස කළ යුතු ඒක දේවත්වයේ පූර්ණත්වයට පටහැනි වේ.

තෙවන වර්ගය වන්නේ ෂිර්කුල් කෆී (සැඟවුණු ෂිර්ක්) වේ. දේව දූත මුහම්මද්තුමාණෝ මෙසේ පැවසූහ. "දජ්ජාල්ටත් වඩා ඔබලා කෙරෙහි මා වැඩි වශයෙන් බිය වන කරුණ පිළිබඳ ඔබලාට මා දැනුම් දිය යුතු නො වේ ද? එවිට සහාබාවරු 'ඔව්, අපට කියා දෙන්න' යැයි පැවසූහ. එවිට එතුමාණෝ 'ෂිර්කුල් කෆී' එනම් යම් පුද්ගලයෙකු තවත් කෙනෙකු තමා දෙස බලන හෙයින් තම සලාතය අලංකාර අයුරින් ඉටු කිරීම වේ." අබූ සර්ද් අල් හුද්රියි සහාබිවරයා මාර්ගයෙන් ඉමාම් අහ්මද්තුමා තම මුස්නද් යන ග්‍රන්ථයෙහි වාර්තා කරයි.

පොදුවේ ෂිර්කය වර්ග දෙකකට පමණක් වර්ග කරනු ලැබීම අනුමත වේ. ෂිර්කුල් අක්බර් (මහා ෂිර්ක්) හා ෂිර්කුල් අස්ගර් (සුළු ෂිර්ක්). ෂිර්කුල් කෆී (සැඟවුණු ෂිර්ක්) මේ දෙකෙහි ම අන්තර්ගත වේ. එය ෂිර්කුල් අක්බර් (මහා ෂිර්ක්) හි අන්තර්ගත වීමට නිදසුන් ලෙස මූනාෆික්වරුන්ගේ ෂිර්කය දැක්විය හැකි ය. මන් ද යත් ඔවුහු තම ජීවිතය කෙරෙහි ඇති බිය නිසා තම මිත්‍යා අකීදාව (ප්‍රතිපත්ති) සඟවාගනිමින් අන් අයට පෙනෙන්නට මුස්ලිම්වරුන් ලෙස ජීවත් වෙති. එමෙන් ම එය ෂිර්කුල් අස්ගර් (සුළු ෂිර්ක්) හි ද අන්තර්ගත වීමට හැකි ය. නිදසුන් ලෙස මූනිච්චාව දැක්විය හැකි ය. ඒ බව

පෙර සඳහන් කරන ලද මහ්මූද් බින් ලුබයිද් අල් අන්සාරි හා අබූ සර්ද් යන සහාබිවරුන් දෙදෙනා වර්තා කරන හදීස්වල සඳහන් වේ.

***

පස්වන පාඩම

අල් ඉහ්සාන්

ඉහ්සාන්හි මූලික ම කරුණ වන්නේ "ඔබ අල්ලාහ් දෙවිඳාණෝ ව දකින්නා සේ හෝ ඔබ ඔහු ව නො දැක්ක ද, ඔහු ඔබ දෙස බලා සිටින්නේය යන හැඟීමෙන් යුතු ව ඔබ ඔහු ව නැමදීම" වේ.

***

හයවන පාඩම

සලාතයේ කොන්දේසි

සලාතයේ කොන්දේසි නවයකි. ඉස්ලාමය, විචාර බුද්ධිය, පරිණත බව, වුළූ කිරීම, අපිරිසිදු දෑ ඉවත් කිරීම (තම ගත, වස්ත්‍රය හා නැමඳුම් කරන ස්ථානය යනාදියෙහි), අව්රතය වසා ගැනීම, නැමඳුම සඳහා නියමිත වේලාව එළඹීම , කිබ්ලාවට මුහුණ ලා සිටීම හා නියියතය (චේතනාව).

හත්වන පාඩම

සලාතයේ මූලිකාංග (අර්කාන්)

සලාතයේ මූලිකාංග දහහතරකි.

හැකියාව ඇති උදවිය නැගිට සිටීම, පළමු තක්බීරය, සූරා අල් ෆාතිහා කියවීම, රුකූ තත්වයට යාම, රුකූවලින් පසු ව ඉ:තිදාල් ඉරියව්වට පැමිණීම, අදාළ හත් අඟ පසඟ පිහිටුවා සුජූද් කිරීම, එයින් නැගී සිටීම, සජදා දෙක අතර හිඳ ගැනීම, සෑම ඉරියව්වක දී ම ඉක්මන් නොවී සන්සුන් ව සිටීම, අනුපිළිවෙළින් ඉටු කිරීම, අවසන් තෂහ්හුදය, ඒ සඳහා හිඳ ගැනීම, දේව දූත මුහම්මද්තුමාණන්ට සලවාත් පැවසීම හා සලාම් දෙකක් ඉටු කිරීම.

***

අටවන පාඩම

සලාතයේ අනිවාර්ය කරුණු (වාජිබාත්)

සලාතයේ අනිවාර්ය කරුණු අටකි. පළමු තක්බීරය හැර අනෙකුත් සියලු ම තක්බීර්, සාමූහික සලාතයේ (නැමඳුමේ) දී ඉමාම්වරයා සහ තනි ව ඉටු කරන සලාතයේ දී එම පුද්ගලයා සමිඅල්ලාහු ලිමන් හමිදහ් (අල්ලාහ් දෙවිඳාණෝ ඔහුට ප්‍රශංසා කළ පුද්ගලයාට සවන් දුන්නෝ ය) යැයි ප්‍රකාශ කිරීම, ඉමාම් හා තනි ව

සලාතය ඉටු කරන්නා යන දෙදෙනා ම රුකූ ඉරියව්වෙහි දී සුබ්හාන රබ්බියල් අලීම් (අති ශ්‍රේෂ්ඨ මාගේ පරමාධිපති සුවි ශුද්ධ ය) යැයි ප්‍රකාශ කිරීම, ඔවුන් දෙදෙනා ම සූජූද්හි දී සුබ්හාන රබ්බියල් අඃලා (අති උසස් මාගේ පරමාධිපති සුවි ශුද්ධ ය) යැයි ප්‍රකාශ කිරීම, සජදා දෙක අතර මැද හිඳුමේ දී රබ්බිග්ෆිර්ලී (මාගේ පරමාධිපතියාණෙනි! මට සමාව දෙනු මැනව) යැයි ප්‍රකාශ කිරීම, අවසන් තෂහ්හුදය හා ඒ සඳහා හිඳ ගැනීම.

***

නවවන පාඩම

තෂහ්හුදය පිළිබඳ විස්තර

මෙහි පළමු කොටස "අත්තහියියාතු ලිල්ලාහි වස්සලවාතු වත්තයියිබාතු අස්සලාමු අලෛක අයියුහන් නබියියු වරහ්මතුල්ලාහි වබරකාතුහු, අස්සලාමු අලෛනා වඅලා ඉබාදිල්ලාහිස්සාලිහීන්, අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු" (සුබ පැතුම්, නැමඳුම් හා යහපත් දෑ සියල්ල අල්ලාහ්ට ම හිමි ය, නබිතුමාණෙනි! ඔබට අල්ලාහ්ගේ ශාන්තිය, දයාව හා අභිවෘද්ධිය අත් වේවා! අපටත් අල්ලාහ්ගේ යහ ගැත්තන්ටත් ශාන්තිය අත් වේවා! අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැත යැයි ද මුහම්මද් ඔහුගේ ගැත්තා සහ දූතයා ලෙස ද මම සාක්ෂි දරමි.) යන්න ය.

දෙවන කොටස දේව දූත මුහම්මද්තුමාණන්ට සලවාත් පැවසීම හා අභිවෘද්ධිය පැතීම වේ. එය මෙසේ ය. "අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත් අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්, වබාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්" (අල්ලාහ් දෙවිඳාණෙනි! ඔබ ඉබ්රාහීම් හා එතුමාගේ පවුලේ උදවිය ප්‍රශංසාවට පාත්‍ර කළා සේ මුහම්මද් හා එතුමාගේ

පවුලේ උදවිය ප්‍රශංසාවට පාත්‍ර කරනු මැනව! සැබැවින් ම ඔබ ප්‍රශංසනීය හා කීර්තිමත් ය. තව ද ඔබ ඉබ්රාහීම්ට හා එතුමාගේ පවුලේ උදවියට යහපතෙහි අභිවෘද්ධිය ඇති කළා සේ මුහම්මද්ට හා එතුමාගේ පවුලේ උදවියට යහපතෙහි අභිවෘද්ධිය ඇති කරනු මැන! සැබිවින් ම ඔබ ප්‍රශංසනීය හා කීර්තිමත් ය.) පසු ව අවසන් තෂහ්හුද්හි අපායේ හා කබ්ර්හි (මිනීවලෙහි) වේදනාවෙන් මිදීමට සහ ජීවත් ව සිටින්නන්ගේ මෙන් ම මරණයට පත් වූවන්ගේ උවදුරුවලින් හා දජ්ජාල්ගේ උවදුරෙන් මිදීම පිණිස අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතීම.

පසු ව තමන්ට අභිමත පරිදි අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම. විශේෂයෙන් ම මුහම්මද්තුමාණන් ප්‍රාර්ථනා කළා වූ ප්‍රාර්ථනා මඟින් අල්ලාහ්ගෙන් අයැද සිටීම වැදගත් ය. ඒවායින් කිහිපයක් පහත දක්වමු.

"අල්ලාහුම්ම අඉන්නී අලා දික්රික වෂුක්රික වහුස්නි ඉබාදතික්, අල්ලාහුම්ම ඉන්නී ළලම්තු නෆ්සියි ළුල්මන් කසීරා, වලා යග්ෆිරුද්දුනූබ ඉල්ලා අන්ත, ෆග්ෆිර්ලියි මග්ෆිරතන් මින් ඉන්දික්, වර්හම්නියි ඉන්නක අන්තල් ගෆූරුර් රහීම්" (අල්ලාහ් දෙවිඳාණෙනි! ඔබ සිහිපත් කිරීමටත් ඔබට ස්තුති පුද කිරීමටත් ඔබ නිවැරදි අයුරින් නැමදීමටත් මා හට පිහිට වනු මැනව! අල්ලාහ් දෙවිඳාණෙනි! මම මා හට ම බොහෝ අපරාධ කරගතිමි. පාපක්ෂමාව ලබා දීමට ඔබ හැර වෙනත් කිසිවෙකුත්

නොමැත. එබැවින් ඔබ මාගේ පාපයන් කමා කරනු මැනව! මා හට කරුණාව දක්වනු මැනව! සැබැවින් ම ඔබ මහා කාරුණික හා පාපක්ෂමාව ලබා දෙන්නා වේ.)

ලුහර්, අසර්, මග්රිබ් හා ඉෂා සලාත්වල පළමු තෂහ්හුද්හි ෂහාදා දෙක පැවසීමෙන් පසු තෙවන රකාතයට නැගී සිටීම. එමෙන් ම, කෙනෙකු පළමු තෂහ්හුද්හි ෂහාදා දෙක පැවසීමෙන් අනතුරු ව, දේව දූත මුහම්මද්තුමාණන්ට සලවාත් පවසා, තෙවන රකාතයට නැගී සිටියේ නම්, එය වඩා උතුම් ය.

දහවන පාඩම

සලාතයේ සුන්නත් (වෛකල්පිත) දෑ

ඒවා නම්:

1- අල් ඉස්තිෆ්තාහ්

2- රුකූ ඉරියව්වට පෙර සහ පසු සිටගෙන සිටින අවස්ථාවේ දී දකුණු අතේ මැණික් කටුව වම් අතේ මැණික් කටුව මත තබා දෑත් බැඳ පපු ප්‍රදේශය මත තබා ගැනීම.

3- පළමු තක්බීර් අවස්ථාවේ දී දෑතෙහි ඇඟිලි එකට එක් කොට දිග හැර, උරහිසෙහි හෝ කණෙහි මට්ටමට දෙඅත් එසවීම. මේ ආකාරයට රුකූ ඉරියව්වේ දීත් එයින් නැගිටින විට දීත් පළමු තෂහ්හුදයෙන් පසු තෙවන

රකාතය සඳහා සිටගැනීමේ ආරම්භක අවස්ථාවේ දීත් සිටිය යුතු ය.

4- රුකූ හා සුජූද් අවස්ථාවේ දී ඊට අදාළ ප්‍රාර්ථනාව එක් වතාවකට වඩා වැඩියෙන් පැවසීම.

5- රුකූ ඉරියව්වෙන් පසු ව සිටගෙන සිටින අවස්ථාවේ දී "රබ්බනා වලකල් හම්ද්" (අපගේ පරමාධිපතියාණෙනි! සියලු ප්‍රශංසා ඔබට ම හිමි ය.) යන ප්‍රාර්ථනාවේ ඇති අනෙකුත් වදන් ද සජදා දෙක අතර, මැද හිඳුමේ දී පාපක්ෂමාව සඳහා වන ප්‍රාර්ථනාව ද එක් වතාවකට වඩා පැවසීම.

6- රුකූ අවස්ථාවේ දී කොන්ද ඉදිරියට නමා, තම හිස ඉණට සමාන්තරව තබා ගැනීම.

7- සුජූද් අවස්ථාවේ දී තම බාහු ඉළ ඇට ප්‍රදේශයෙන් ද තම උදරය කලවා ප්‍රදේශයෙන් ද තම කලවා දණහිසෙන් පහළ ප්‍රදේශයෙන් ද ඈත් කොට තබා ගැනීම.

8- සුජූද් අවස්ථාවේ දී වැලමිට හා මැණික් කටුව අතර ප්‍රදේශය පොළවට ස්පර්ශ නො වන අයුරින් තබා ගැනීම.

9- පළමු තෂහ්හුද් හා සජදා දෙක අතර මැද හිඳුමෙහි සිටින අවස්ථාවේ දී තම වම් කකුළෙහි පාදය දකුණත පැත්තට හරවා පොළවට ස්පර්ශ වන අයුරින් හා තම දකුණු කකුළෙහි පාදය, එම පාදයේ ඇඟිලි තුඩුවලින් සිටුවා තබා ගැනීම.

10- රකාඅත් තුනේ හා හතරේ සලාතයන්හි අවසන් තෂහ්හුද්හි තවර්රුක් ක්‍රමයට හිඳ ගැනීම. එනම්, තම දකුණු කකුළෙහි පාදය එහි ඇඟිලි තුඩුවලින් සිටුවා ඊට යටින් තම වම් පාදය දමා, වම් තට්ටම මත හිඳ ගැනීම වේ.

11- පළමු හා දෙවන තෂහ්හුද් සඳහා හිඳ ගත් මොහොතේ සිට අවසානය තෙක් දබර ඇඟිල්ල දික් කර තබා ගැනීම හා ප්‍රාර්ථනාව පවසන මොහොතේ එය සෙලවීම.

12- පළමු තෂහ්හුද්හි මුහම්මද්තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් සහ ඉබ්රාහීම්තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ උදවියටත් සලවාත් පැවසීම හා අභිවෘද්ධිය සඳහා ප්‍රාර්ථනා කිරීම.

13- අවසන් තෂහ්හුද්හි අදාළ ප්‍රර්ථනාවලින් පසු ව අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම.

14- ෆජ්ර්, ජුම්ආ, අවුරුදු හා වර්ෂාව පතා ඉටු කරනු ලබන සලාත්වල දී ද මග්රිබ් හා ඉෂා සලාත්වල පළමු රකාත් දෙකේ ද සූරා අල් ෆාතිහාව සහ ඊට අමතර ව කියවනු ලබන සූරාව ශබ්ද නගා කියවිය යුතු ය.

15- ලුහර්, අසර් සලාත්වල දී ද, මග්රිබ් සලාතයේ අවසන් රකාතයේ දී ද, ඉෂා සලාතයේ අවසන් රකාත් දෙකේ දී ද,

සූරා අල් ෆාතිහාව සහ ඊට අමතර ව කියවනු ලබන සූරාව ශබ්ද නැගීමකින් තොර ව කියවිය යුතු ය.

16- සූරා ෆාතිහාවට පසු ව තවත් සූරාවක් කියවීම. අප සඳහන් කළ කරුණුවලට අමතර තවත් බොහෝ සුන්නතයන් ඇත. ඒවා අතුරින්, රුකූ ඉරියව්වෙන් පසු සිටගෙන සිටින අවස්ථාවේ දී "රබ්බනා වලකල් හම්ද්" යනුවට වඩා වැඩිපුර තිබෙන වදන් පැවසීම ඉමාම්වරයා, ඉමාම්වරයා අනුගමනය කරමින් සලාතයේ යෙදෙන උදවිය සහ තනි ව සලාතය ඉටු කරන උදවිය සඳහා සුන්නත් වූ විෂයකි.එමෙන්ම රුකූ අවස්ථාවේ දී දෑතෙහි ඇඟිලි එකට එකතු නොකොට ඒවා අතර හිඩැසක් හිටින සේ ඇඟිලි මඳක් ඇත් කොට දණහිස් මත තබා ගැනීම ද එම සුන්නත් වූ කරුණුවලින් එකකි.

එකළොස්වන පාඩම

සලාතය අවලංගු කරවන කරුණු

සලාතය අවලංගු කරවන කරුණු අටකි.

1- දැන දැන උවමනාවෙන් ම කතා කිරීම. නමුත් නොදැනුවත්කමකින් හා අමතක වීමකින් එසේ වුවහොත් සලාතය අවලංගු නො වේ.

2- සිනාසීම.

3- අහාර අනුභව කිරීම.

4- පානය කිරීම.

5- අව්රතය (කෙනෙකු සලාතයේ දී අනිවාර්යයෙන් ම වැසිය යුතු ශරීර අවයව) දිස් වීම.

6- කිබ්ලා දිශාවේ සිට වෙනත් දිශාවකට වැඩිපුර හැරීම.

7- සලාතයේ දී එක දිගට අධික ලෙස අනවශ්‍ය ක්‍රියාවල නියැලීම.

8- පිරිසිදු භාවය නොමැති වීම.

***

දොළොස්වන පාඩම

වුළූහි කොන්දේසි

වුළූහි කොන්දේසි 10කි.

ඉස්ලාමය, විචාර බුද්ධිය, පරිණත භාවය, චේතනාව, වුළූ අවසන් වන තුරු ම එම චේතනාවෙන් ම පසු වීම (වුළූ අවසන් වීමට පෙර තමන් වුළූ කිරීමෙන් මිදෙනවා යනුවෙන් නො සිතීම.), වුළූ අනිවාර්ය වන කරුණුවලින් මිදී සිටීම, ඉස්තින්ජා (මළපහ හෝ මුත්‍රා ජලයෙන් පිරිසිදු කිරීම) හා ඉස්තිජ්මාර් (මළපහ හෝ මුත්‍රා ගල්, කඩදාසි හා ශාක පත්‍රවලින් පිරිසිදු කිරීම) කිරීමට පෙර වුළූ කිරීමෙන් වැළකී සිටීම, වුළූ සඳහා භාවිතා කරන ජලය පිරිසිදු හා හලාල් වීම, ජලය සමට

වැදීම වලක්වන දෑ ඉවත් කිරීම හා නිතර නිතර වුළු කඩවන පුද්ගලයා සලාතයේ වේලාව උදා වූ පසු වුළු කිරීම ආරම්භ කිරීම.

***

දහතුන්වන පාඩම

වුළුහි අනිවාර්ය කරුණු

වුළුහි අනිවාර්ය කරුණු හයකි. මළ්මළා (කට තුළට ජලය යවා කට සේදීම) හා ඉස්තින්ෂාක් (නාසය තුළට ජලය යවා පිරිසිදු කිරීම) කිරීමත් සමග ම මුහුණ සේදීම, වැලමිට දක්වා දෑත් සේදීම, කණත් සමග ම හිස සම්පූර්ණයෙන් පිරිමැදීම, වළලුකර දක්වා දෙපා සේදීම, අනුපිළිවෙළින් කිරීම හා නො නවත්වා අඛණ්ඩ ව කිරීම. මුහුණ, දෑත් හා දෙපා තෙවතාවක් සේදීම මුස්තහබ් (ප්‍රියජනක) වේ. එමෙන් ම මළ්මළා හා ඉෂ්තින්ෂාක් කිරීම ද තෙවතාවක් කිරීම මුස්තහබ් (ප්‍රියජනක) වේ. නමුත් අනිවාර්ය වන්නේ එක් වරක් කිරීම ය. නිවැරදි හදීස්වලට අනුව හිස පිරිමැදීම එසේ තෙවතාවක් කිරීම මුස්තහබ් (ප්‍රියජනක) නො වේ.

දහහතරවන පාඩම

වුළූ අවලංගු වන කරුණු

වුළූ අවලංගු වන කරුණු හයකි.

ඉදිරිපස හා පසුපස විවරවලින් යමක් පිටවීම, පිළිකුල් සහගත අපිරිසිදු යමක් ශරීරයෙන් පිටවීම, නින්ද හෝ වෙනත් කරුණක් හේතුවෙන් සිහිබුද්ධිය නොමැති වීම, කිසිදු තිරයකින් තොර ව තම අතින් රහසඟ ස්පර්ශ කිරීම, ඔටු මස් අනුභව කිරීම හා ඉස්ලාමයෙන් බැහැර වීම (එයින් අප සියල්ල අල්ලාහ් ආරක්ෂා කරත්වා!).

සටහන: මෘත දේහයක් ස්නානය කරවීම යන කරුණෙහි නිවැරදි ම මතය වන්නේ එය වුළූ අවලංගු වන කරුණක් නො වේ යන්න ය. මේ සඳහා සෘජු හදීසයක් නොමැති හෙයින් බොහෝ වියතුන්ගේ මතය එය වේ. නමුත් මෘත දේහය ස්නානය කරවන මොහොතේ දී ස්නානය කරවන්නාගේ අත කිසිදු තිරයක් නොමැති ව මෘත දේහයේ රහසඟෙහි ස්පර්ශ වූයේ නම් ඔහුට වුළූ කිරීම අනිවාර්ය වේ.

මෙහි දී තිරයක් නොමැති ව මෘත දේහයේ රහසඟ ස්පර්ශ කිරීමෙන් වැලකී සිටීම ඔහුට අනිවාර්ය වේ. තව ද ආගමික වියතුන්ගේ මත අතුරින් නිවැරදි ම මතය වන්නේ, කිසියම් පුද්ගලයෙකු ආශාවකින් හෝ ආශාවකින් තොර ව, කාන්තාවක ස්පර්ශ කිරීම

හේතුවෙන් ඔහුගේ ශරීරයෙන් කිසිවක් පිට නොවූයේ නම් ඔහුගේ වුළූ අවලංගු නො වේ යන්න ය. මන් ද යත් දේව දූත මුහම්මද්තුමාණන් එතුමාණන්ගේ සමහර භාර්යාවන් සිපගෙන, පසු ව වුළූ නො කර සලාත් කර ඇති හෙයිනි.

අල්ලාහ් දෙවිඳාණෝ සූරා නිසා හා සූරා මාඉදාහි මෙසේ දේශනා කරයි. "ඔබලා කාන්තාවන් ඇසුරු කළේ නම්" {සූරා නිසා:43} {සූරා මාඉදා: 06} මෙහි අදහස සංසර්ගය යන්න ආගමික වියතුන්ගේ මත අතුරින් නිවැරදි මතය වේ. ඉබ්නු අබ්බාස්තුමාගේ මෙන් ම සලෆ් හා කලෆ්වරුන් අතුරින් එක් කණ්ඩායමක මතය ද මෙය යි. සැබැවින් ම අල්ලාහ් සාර්ථකත්වයේ හිමිකරු ය.

***

පහළොස්වන පාඩම

සෑම මුස්ලිම්වරයෙකු සතු ව ම තිබිය යුතු යහ ගුණාංග

ඒවා නම්:

සද්භාවය, අවංකකම, සිල්වත්භාවය, විළිබිය ඇත්තෙකු වීම, වීරත්වය, ත්‍යාගශීලිත්වය, පොරොන්දු ඉටු කිරීම, අල්ලාහ් තහනම් කළ සියලු ම කරුණුවලින් ඉවත් ව සිටීම, යහපත් අසල්වැසියෙකු ව සිටීම, දුප්පත්

උදව්යට පිහිට වීම හා උතුම් අල් කුර්ආනයේ හා හදීස්හි සඳහන් අනෙකුත් යහ ගුණාංග

***

දහසයවන පාඩම

ඉස්ලාමීය සිරිත් විරිත්

ඒවා නම්:

සලාම් පැවසීම, නිතර ම සිනහමුසු මුහුණින් සිටීම, දකුණතින් අහාර ගැනීම හා පානය කිරීම, ඕනෑ ම කටයුත්තක් ආරම්භ කරන මොහොතේ "බිස්මිල්ලාහ්" (අල්ලාහ්ගේ නාමයෙන් කරමි) යැයි පැවසීම, ඕනෑ ම කටයුත්තක් අවසන් වූ පසු "අල්හම්දු ලිල්ලාහ්" (පැසසුම් සියල්ල අල්ලාහ්ට ම හිමි ය) යැයි පැවසීම, කිවිසුම් යෑමෙන් පසු "අල්හම්දු ලිල්ලාහ්" යැයි පැවසීම, එසේ පැවසීම කවරෙකුට කණ වැකෙන්නේ ද ඔහු "යර්හමුකල්ලාහ්" (අල්ලාහ් ඔබට කරුණාව දක්වත්වා!) යැයි පැවසීම, රෝගීන්ගේ සුවදුක් විමසීම, අවමගුල් අවස්ථාවක දී දේහය පිටුපසින් යෑම මෙන් ම ජනාසා (දේහය උදෙසා කරන) සලාතයට හා දේහය වැළලීමේ කටයුතුවලට සහභාගී වීම, මස්ජිදයකට හෝ නිවසකට පිවිසීමේ දී ද, එයින් බැහැර වීමේ දී ද, ගමනක් යන අවස්ථාවේ දී ද, ඉස්ලාමීය පිළිවෙත අනුගමනය කිරීම,

දෙමව්පියන්, නෑදෑ හිතවතුන්, අසල්වැසියන්, වැඩිහිටි උදවිය හා කුඩා දරුවන් සමඟ යහපත් අයුරින් හැසිරීම, දරු උපතක දී සුබ පැතීම, විවාහ උත්සවයක දී අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම, කරදරයක පැටලී සිටින උදවිය වෙත ගොස් ඔවුන්ගේ සිත් සැනසීම සහ ඇඳුම් පැළඳුම්, සෙරෙප්පු පළඳින විට හා ගලවන විට යනා දී තවත් බොහෝ කරුණුවල දී ඉස්ලාමීය සිරිත් විරිත් අනුගමනය කිරිම.

***

දහහත්වන පාඩම

ෂිර්ක් කටයුතු හා පාපී කටයුතුවලින් වැලකී සිටින මෙන් අවවාද කිරීම.

ඒවායින් විනාශකාරී මහා සත් අකුසල් හෙවත් අස්සබ්උල් මූබ්බිකාත් ප්‍රධාන වේ. එනම්, අල්ලාහ් කෙරෙහි ආදේශ තැබීම, හූනියම, කිසිදු සාධාරණ හේතුවකින් තොර ව මිනිස් ජීවිතයක් ඝාතනය කිරීම, පොලිය, අනාථ දරුවන්ගේ මුදල් හා දේපළ අවභාවිතය, ජිහාද්හි යුදමය තත්ත්වයක දී පැන දිවීම, සැදැහැවත් විශ්වාසවන්ත ස්ත්‍රීන්ට අවලාද නැගීම වේ.

තව ද දෙමව්පියන්ට හිරිහැර කිරීම හා වේදනාවට පත් කිරීම, නෑදෑ සබඳතා බිඳීම, බොරු සාක්ෂි ලබා දීම,

අසත්‍ය දිවුරුම් දීම්, අසල්වැසියන්ට හිරිහැර කිරීම, අන් අයගේ ජීවිතය, දේපළ හා ගෞරවය යන කරුණුවල අසාධාරණ ලෙස කටයුතු කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය, සූදුව, තමන් ඉදිරියේ නොමැති කෙනෙකුගේ අඩුපාඩු කීම, කේලම් කීම හා දේව දූත මුහම්මද්තුමාණන් තහනම් කළ අනෙකුත් කරුණු කාරණා ද මීට අන්තර්ගත ය.

***

දහඅටවන පාඩම

මෘත දේහයක් වැළලීම සඳහා සූදානම් කිරීම, දේහය සඳහා සලාතය හෙවත් නැමඳුම ඉටු කිරීම හා වැළලීම

උක්ත කරුණු මෙලෙස පැහැදිලි කළ හැක:

♦ ප්‍රථමයෙන් මරණාසන්න පුද්ගලයෙකුට "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" යන ප්‍රකාශය සිහි කර (කියා) දීම.

ධර්ම දූත මුහම්මද්තුමාණන්ගේ සම්ප්‍රදාවලට අනුව මරසාන්න පුද්ගලයෙකුට "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" යන ප්‍රකාශය සිහ කර දීම ආගමානුකූල කරුණකි. එතුමාණෝ මෙලෙස දේශනා කර ඇත්තෝ ය. "ඔබලා අතුරින් මරණාසන්න පුද්ගලයන්ට 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන ප්‍රකාශය සිහි කර දෙන්න."

ඉමාම් මුස්ලිම් සිය සහීහ් ග්‍රන්ථයේ වාර්තා කර ඇත.

ඉහත හදීසයේ "මව්තා" යන වචනයෙන් අදහස් කරන්නේ "මරණාසන්න උදවිය" යන්න යි.

♦ දෙවනුව: යමෙකු මරණයට පත් වූයේ යැයි තහවුරු වූ විගස ඔහුගේ දෙඇස් වසා දැමිය යුතු අතර ඔහුගේ හනු ප්‍රදේශය එකට එක් කොට තැබිය යුතු ය.

මෙලෙස කටයුතු කළ යුතු බවට නබිතුමාණන්ගේ මුතුවදන් හෙවත් හදීස්වල සඳහන් ය.

♦ තෙවනුව: යුද්ධයක දී ෂහීද්වරයෙකු ලෙස මරණයට පත් කෙනෙකුගේ දේහය හැර අන් සෑම මුස්ලිම් දේහයක් ම ස්නානය කරනු ලැබීම අනිවාර්ය වේ.

ෂහීද්වරයාගේ දේහය ස්නානය කරනු නො ලබන අතර එම දේහය වෙනුවෙනු සලාතය හෙවත් නැමඳුම ද ඉටු කරනු නො ලැබේ. එලෙස කිරීමට හේතුව දේව දූත මුහම්මද්තුමාණන් ෂහීද්වරයෙකු ලෙස මරණයට පත් කිසිදු කෙනෙකුගේ දේහය ස්නානය කර නොමැති අතර ඒ වෙනුවෙන් සලාතය ද ඉටු කර නොමැති නිසා ය.

♦ සිව්වන කරුණ වන්නේ දේහය ස්නානය කරවන අකාරය යි.

එහි දී ඔහුගේ අව්රතය හෙවත් වැසිය යුතු අනිවාර්ය ශරීරාංග වැසිය යුතු ය. පසු ව මඳක් ඔසවා උදරය මෘදු

ලෙස තද කළ යුතු ය. අනතුරු ව ස්නානය කරවන්නා තම අතෙහි රෙදි කඩක් හෝ එවැනි යමක් ඔතා උදරයෙන් පිටවන දෑ ඉවත් කළ යුතු ය. ඉන් පසු සලාතයට වුළූ කරන්නා සේ වුළූ කරවිය යුතු ය. පසු ව හිස හා රැවුල ජලය හා සිද්ර් (සබන් මෙන් පෙණ නැගෙන ශාක පත්‍රයක්) යන ඒවායින් හෝ එවැනි යමකින් සේදිය යුතු ය. ශරීරයේ දකුණු පැත්ත සෝදා පසු ව වම් පැත්ත සේදිය යුතු ය. මෙලෙස තෙවරක් සේදිය යුතු ය. ඒ සෑම අවස්ථාවක දී ම ඉහත සඳහන් අයුරින් අතින් උදරය තරමක් තද කළ යුතු අතර එයින් අසූචි යමක් පිටවූයේ නම් එය සේදිය යුතු ය. පසු ව පුළුන්වලින් හෝ එවැනි යමකින් එම අසූචි පිටවන ස්ථානය වසා දැමිය යුතු ය. එසේ කිරීමෙන් එම ස්ථානය වැසිය නො හැකි වූයේ නම් පවිත්‍ර මැටි භාවිතයෙන් හෝ නූතන වෛද්‍ය විද්‍යාවේ භාවිත ගම් වැනි යමකින් එය වසා දැමිය යුතු ය. පසු ව නැවතත් වුළූ කරවිය යුතු අතර තෙවරක් සේදීමෙන් දේහය පිරිසිදු නො වූයේ නම් පස්වරක් හෝ හත්වරක් දක්වා සේදිය හැකි ය.

ඉන් අනතුරු ව දේහය තුවායකින් හෝ රෙදි කඩකින් පිස දමා, ශරීරයේ අපිරිසිදු දෑ එකතු වන කිහිල්ල හා කලවාහි ඇතුළත ප්‍රදේශය වැනි ස්ථානවල මෙන් ම සුජූද් කරන විට පොළවට ස්පර්ශ වන ස්ථානවල ද සුවඳ විලවුන් ගැල්විය යුතු ය. මුළු ශරීරයට ම සුවඳ විලවුන් ගැල්වීම වඩාත් ප්‍රියජනක ය. බහූර් හෝ එවැනි සුවඳ දෑ

(සාම්බ්රානි වැනි) මඟින් කෆන් රෙද්දට (දේහය මතනු ලබන රෙදි කඩට) දුම් ඇල්ලීම සිදු කළ යුතු වේ. උඩු රැවුල හා නියපොතු දිගට වැවී ඇත්නම් ඒවා කැපිය යුතු ය. නමුත් එසේ නො කළ ද වරදක් නොමැත. පැහැදිළි හා නිවැරදි සාධක නොමැති හෙයින් හිසකෙස් හා වසා රොද ඉවත් කිරීම ද කත්නා හෙවත් චර්ම ඡේදනය ද නො කළ යුතු ය. කාන්තා දේහයක හිසකෙස් දෙපැත්තෙන් හා මැදින් යනුවෙන් ස්ථාන තුනකින් ගෙන ගොතා පිටුපසට වන සේ තැබිය යුතු ය. පස්වන කරුණ වන්නේ දේහය කෆන් කිරීම හෙවත් රෙදි කඩකින් එතීම වේ.

♦ පස්වන කරුණ වන්නේ: දේහය කෆන් කිරීම හෙවත් රෙදි කඩකින් එතීම වේ.

පුරුෂයෙකු නම් කමිසයක් හා ජටාවක් නොමැති සුදු පැහැති රෙදි කඩ තුනකින් කෆන් කිරීම වඩා යෝග්‍ය වේ. මන්දයත් දේව දූත මුහම්මද්තුමාණන්ගේ දේහය කෆන් කළේ ද, ඒ අයුරිනි. එනමුත් කමිසයක්, සරමක් හා එක් රෙදි කඩක් මඟින් කෆන් කළ ද වරදක් නොමැත.

කාන්තාවක නම් හැට්ටයක්, හිස් ආවරණයක්, සරමක් හා රෙදි කඩ දෙකක් යන දෑ මඟින් කෆන් කරනු ලැබිය යුතු ය. කුඩා දරුවෙකු නම් එක් රෙදි කඩකින් හෝ දෙකකින් හෝ තුනකින් හෝ කෆන් කළ හැකි ය. කුඩා දැරියක නම් හැට්ටයක් හා රෙදි කඩ දෙකක් මඟින් කෆන් කළ හැකි ය.

ඕනෑ ම කෙනෙකුගේ දේහයක් අවම වශයෙන් දේහය සම්පූර්ණයෙන් ම වැසෙන එක් රෙදි කඩකින් කෆන් කිරීම අනිවාර්ය වේ. දේව දූත මුහම්මද්තුමාණන්ගේ දේශනාවලට අනුව ඉහ්රාම් ඇඳුමෙන් සිටින කෙනෙකු නම් ඔහු ජලයෙන් හා සිද්ර් පත්‍රවලින් ස්නානය කරනු ලැබ එම ඉහ්රාම් ඇඳුමෙන් ම හෝ වෙනත් යමකින් කෆන් කරනු ලැබිය යුතු ය. ඔහුගේ හිස හා මුහුණ වැසිය නො යුතු අතර ම ඔහුට සුවඳ විලවුන් ද නො ගැල්විය යුතු ය. මන් ද යත් ඔහු අවසන් දිනයේ දී තල්බියා යන අල්ලාහ් මෙනෙහි කරනු ලබන ප්‍රකාශය තම මුවින් පවසමින් සිටින කෙනෙකු ලෙස නැගිටුවනු ලැබේ. ඉහ්රාම් ඇඳුමෙන් සිටින්නා කාන්තාවක් නම් ඇය සාමාන්‍ය කාන්තාවක කෆන් කරනු ලබන්නා සේ කෆන් කරනු ලැබිය යුතු අතර සුවඳ විලවුන් නො ගැල්විය යුතු මෙන් ම නිකාබ් නමැති මුහුණු වැස්මකින් ඇගේ මුහුණ ද දෑත් වැස්මකින් ඇගේ දෑත ද වැසිය නො යුතු ය. මුහුණ හා දෑත කෆන් කරනු ලබන රෙදි කඩින් ම වැසිය යුතු ය.

♦ හයවන කරුණ වන්නේ: දේහය ස්නානය කරවීම, වැළලීම හා සලාතය ඉටු කිරීම යන කටයුතු කිරීමට ඉතා සුදුසු ම උදවිය.

මේ සඳහා සුදුසු ම උදවිය අතුරින් වසියියත් හෙවත් අදාළ පුද්ගලයා මිය යෑමට පෙර කවරෙකුට ඉහත කටයුතු කිරීමට පැවරුවේ ද එම පුද්ගලයා මුල්තැන් ගනී.

ඔහු නොමැති නම් මිය ගිය කෙනාගේ පියා ද, අනතුරු ව සීයා ද, ඉන් අනතුරු ව පුත්‍රයා ද, යනුවෙන් ඥාතීත්වයේ සමීප භාවය අනුව සුදුසු ම පුද්ගලයා තීරණය වේ.

කාන්තා දේහයක් නම් එම කාන්තාව මිය යෑමට පෙර කවරෙකුට එම කටයුතු කිරීමට පැවරුවේ ද, එම පුද්ගලයා මුල්තැන් ගනී. ඔහු නොමැති විට මිය ගිය කාන්තාවගේ මව ද, අනතුරු ව ආච්චි ද, ඉන් අනතුරු ව දුව ද, යනුවෙන් ඥාතීත්වයේ සමීප භාවය අනුව සුදුසු ම පුද්ගලයා තීරණය වේ. ස්වාමි පුරුෂයාට තම භාර්යාව ද, භාර්යාවට තම ස්වාමි පුරුෂයා ද, ස්නානය කරවිය හැකි ය. මන් ද යත් අබූ බක්ර්තුමාගේ දේහය එතුමාගේ භාර්යාව ද, ෆාතිමාතුමියගේ දේහය එතුමියගේ සැමියා වන අලිතුමා ද, ස්නානය කරවා ඇත.

♦ හත්වන කරුණ වන්නේ: මයියිතය හෙවත් දේහය සඳහා කරනු ලබන සලාතය ඉටු කරන ආකාරය.

මෙම සලාතය තක්බීර් (අල්ලාහු අක්බර් යන ප්‍රකාශය) හතරකින් සමන්විත වේ. පළමු තක්බීරයෙන් පසු සූරා අල්ෆාතිහා කියවනු ලැබේ. ඒ සමඟ තවත් කෙටි සූරාවක් හෝ වැකියක් හෝ වැකි කිහිපයක් හෝ කියවනු ලැබුවේ නම් එය වඩාත් ප්‍රියජනක ය. පසු ව දෙවන තක්බීරය පවසා, සලාතයේ තෂහ්හුද්හි දේව දූත මුහම්මද්තුමාණන් උදෙසා පවසන සලවාතය පැවසිය යුතු ය. තුන්වන තක්බීරය පැවසීමෙන් අනතුරු ව පහත ප්‍රාර්ථනාව

පැවසිය යුතු ය. "අල්ලාහුම්මග්ෆිර් ලිහයියිනා වමයියිතිනා වෂාහිදිනා වගාඉබිනා වසගීරනා වකබීරනා වදකරිනා වඋන්සානා, අල්ලාහුම්ම මන් අහ්යයිතනා මින්නා ෆඅහ්යිහි අලල් ඉස්ලාම්, වමන් තවෆ්ෆයිතහු මින්නා ෆතවෆ්ෆහු අලල් ඊමාන්, අල්ලාහුම්මග්ෆිර්ලහු වර්හම්හු වආෆිහි වඃෆු අන්හු ව අක්රිම් නුzසුලහු වවස්සිඃ මුද්කලහු වග්සිල්හු බිල් මාඉ වස්සල්ජි වල්බරද්, වනක්කිහි මිනල් කතායා කමා නක්කයිතස්සව්බල් අබ්යල මිනද් දනස්, ව අබ්දිල්හු දාරන් කයිරන් මින් දාරිහි ව අහ්ලන් කයිරන් මින් අහ්ලිහි ව අද්කිල්හුල් ජන්නත, ව අඉද්හු මින් අදාබිල් කබ්රි ව අදාබින් නාර්, වෆ්සහ් ලහු ෆී කබ්රිහි වනව්විර් ලහු ෆියිහි, අල්ලාහුම්ම ලා තහ්රිම්නා අජ්රහු වලා තුළිල්නා බඃදහ්" තේරුම:- (ඕ අල්ලාහ්! අප අතුරින් ජීවත් ව සිටින උදවියට ද, මරණයට පත් උදවියට ද, අප ඉදිරියේ සිටින උදවියට ද, අප ඉදිරියේ නොසිටින උදවියට ද, කුඩා උදවියට ද, වැඩිහිටි උදවියට ද, පිරිමින්ට ද ,ස්ත්‍රීන්ට ද, ඔබ පාපක්ෂමාව ලබා දෙනු මැන! ඕ අල්ලාහ්! ඔබ ඔහු (මිය ගිය පුද්ගලයා) හට පාපක්ෂමාව ලබා දෙනු මැන! ඔහුට කරුණාව දක්වනු මැන! ඔහුට සුවය ලබා දී සමාව ලබා දෙනු මැන! ඔහුගේ නිවහන අගනා ස්ථානයක් කරනු මැන! ඔහු පිවිසෙන ස්ථානය එනම් මිනී වළ පුළුල් කරනු මැන! ජලය, පිනි හා අයිස් මඟින් ඔහු සෝදා හරිනු මැන! කිළිටි වූ සුදු පැහැති වස්ත්‍රයක් කෙසේ පිරිසිදු කරනු ලබන්නේ ද එලෙස ම

ඔහුගෙන් අකුසල්වලින් ඔහු ව පිරිසිදු කරනු මැන! (මෙලොවෙහි) ඔහුට තිබූ නිවහනට වඩා යහපත් නිවහනක් ද, ඔහුගේ පවුලට වඩා යහපත් පවුලක් ද, ඔබ ඔහුට ලබා දෙනු මැන! කබ්රයේ (මිනී වළ) වේදනාවෙන් හා අපායේ වේදනාවෙන් ඔහු මුදවා ගෙන, ස්වර්ගස්ථ කරනු මැන! තව ද කබ්රය ඔහුට විස්තීර්ණ කර, කබ්රයේ දී ඔහුට ආලෝකය ලබා දෙනු මැන! ඕ අල්ලාහ්! ඔහුගේ අවමඟුල් කටයුතුවලට දායක වීමෙන් අපට හිමි කුසල් අප ලබා දීමෙන් නො වළක්වනු මැන! ඔහුගේ මරණයෙන් පසු අප නොමග යන තත්ත්වයට පත් නො කරනු මැන!) පසු ව සිව්වන තක්බීරය පවසා, තම දකුණත පැත්තට එක් සලාමයක් දිය යුතු ය. සෑම කත්බීරයක් සමඟ ම දෑත් එසවීම සුන්නත් වන අතර ජනාසාව (මෘත දේහය) කාන්තාවකගේ නම් "අල්ලාහුම්මග්ෆිර්ලහා" (ඕ අල්ලාහ්! ඇයගේ අකුසල් කමා කරනු මැන!) යනුවෙන් කාන්තාවකට අදාළ වන අයුරින් එම ප්‍රාර්ථනාව පැවසිය යුතු ය. ජනාසා (මෘත දේහ) දෙකක් නම් "අල්ලාහුම්මග්ෆිර්ලහුමා" (ඕ අල්ලාහ්! ඔවුන් දෙදෙනාගේ අකුසල් කමා කරනු මැන!) යනුවෙන් දෙදෙනෙකුට අදාළ වන අයුරින් එම ප්‍රාර්ථනාව පැවසිය යුතු ය. ජනාසා (මෘත දේහ) දෙකකටත් වඩා වැඩි නම් "අල්ලාහුම්මග්ෆිර්ලහුම්" (ඕ අල්ලාහ්! ඔවුන්ගේ අකුසල් කමා කරනු මැන!) යනුවෙන් බහුවචන ස්වරූපයෙන්

එම ප්‍රාර්ථනාව පැවසිය යුතු ය. ළදරුවෙකුගේ හෝ කුඩා දරුවෙකුගේ ජනාසාවක් නම් පහත අයුරින් පැවසිය යුතු ය. "අල්ලාහුම්මජ්අල්හු ෆරතන් ව සුහ්රන් ලිවාලිදයිහි, වෂෆීඅන් මුජාබා, අල්ලාහුම්ම සක්කිල් බිහි මවාසියිනහුමා, ව අෘලිම් බිහි උජුව්රහුමා, ව අල්හික්හු බිසාලිහි සලෆිල් මුඃමිනීන්, වජ්අල්හු ෆියි කෆාලති ඉබ්රාහීම් අලයිහස්සලාතු වස්සලාම්, වකිහි බිරහ්මතික අදාබල් ජහීම්." (ඕ අල්ලාහ්! ඔබ එම දරුවා ඔහුගේ දෙමව්පියන්ට ඉතිරි කොට තබන ලද කුසලක් වශයෙන් ද (තමන්ගේ ඉල්ලීම අල්ලාහ් විසින්) පිළිගනු ලැබූ මැදිහත්කරුවෙකු ලෙසත් පත් කරනු මැන. ඕ අල්ලාහ්! ඔහුගේ මරණය හේතුවෙන් ඔහුගේ දෙමව්පියන්ගේ (කුසල් අකුසල් කිරනු ලබන) තුලාවේ කුසල් පැත්තෙහි බර වැඩි කර, ඔවුන්ගේ කුසල් දෙගුණ තෙගුණ කරනු මැන! සැදැහැවත් විශ්වාසවන්තයින් සමඟ ඔහු එකතු කරනු මැන! දේව දූත ඉබ්රාහීම්තුමාගේ භාරයේ ඔහු පත් කරනු මැන! ඔබගේ කරුණාව මඟින් අපායේ වේදනාවෙන් ඔහු මුදවා ගනු මැන!) පිරිමියකුගේ දේහයක් නම් සලාතය ඉටු කරන ඉමාම්වරයා දේහයේ හිසට සමාන්තර ව සිටගැනීම හා කාන්තා දේහයක දී ඉමාම්වරයා දේහයේ මැදට වන්නට එනම් දේහයේ මැද ප්‍රදේශයට සමාන්තර ව සිටගැනීම සුන්නත් හෙවත් ප්‍රියජනක වේ. දේහයන් බොහෝමයක් තිබෙන විටක දී පුරුෂයාගේ දේහය ඉමාම්වරයාට සමීප වන අයුරින් හා

කාන්තාවගේ දේහය කිබ්ලා දෙසට සමීප වන අයුරින් තැබිය යුතු ය. එම දේහ අතර කුඩා දරුවෙකු සිටී නම් පළමුව පිරිමියාගේ දේහයත් දෙවනුව කුඩා දරුවාගේ දේහයත් පසු ව කාන්තාවගේ දේහයත් යන අයුරින් තැබිය යුතු ය. කුඩා දැරියකගේ දේහයකුත් ඒ අතර තිබේ නම් එය කාන්තා දේහයට පසු ව තැබිය යුතු ය. කුඩා දරුවාගේ හිස පුරුෂයාගේ හිසට සමාන්තර ව ද කාන්තාවගේ මැද ප්‍රදේශය පිරිමියාගේ හිසට සමාන්තර ව ද තැබිය යුතු ය. එමෙන් ම කුඩා දැරියගේ හිස කාන්තාවගේ හිසට සමාන්තර ව තැබිය යුතු අතර ඇගේ මැද ප්‍රදේශය පුරුෂයාගේ හිසට සමාන්තර ව තැබිය යුතු වේ. නැමඳුම්කරුවන් සියල්ලන් ම ඉමාම්වරයාට පසුපසින් සිටිය යුත අතර කවරෙකුට හෝ පිටුපසින් ඉඩක් නො ලැබුණේ නම් ඔහුට ඉමාම්වරයාගේ දකුණත පැත්තෙන් සිටගත හැකි ය.

♦ අටවන කරුණ වන්නේ: දේහය වළලන ආකාරය වේ.

මෙහි දී ආගමානුකූල ක්‍රමය වන්නේ පුරුෂයාගේ මැදට වන තුරු කබ්රය හෙවත් මිනීවළ ගැඹුරු කළ යුතු අතර එම වළෙහි කිබ්ලාව දෙසට වන්නට ලහ්ද් එනම් මිනී වළෙහි කිබ්ලාව දෙසට සමීපතම බිත්තිය අසළින් දික්අතට තවත් කුඩා වළක් හෑරිය යුතු ය. මෙම ලහ්ද් නමැති වළෙහි දේහය එහි දකුණත පැත්තට වන්නට

කිබ්ලාවට මුහුණ ලා තැන්පත් කර, කෆන් රෙදි කඩ ගැට ගසන ලද ලණුවල ගැට ලිහා දැමිය යුතු අතර කෆන් රෙදි කඩ නො ගැලවිය යුතු ය. දේහය පිරිමියෙකුගේ හෝ කාන්තාවකගේ හෝ වුව ද දේහයේ මුහුණ නිරාවරණය නො කළ යුතු වේ. පසු ව ලබින් (තෙත් සහිත පසින් සාදා ගත් ගඩොල් වැනි යමක්) මඟින් දේහය මතට පස් නො වැටෙන සේ ලහ්ද් නමැති කුඩා වළ වැසිය යුතු ය. දේහය මත පස් නො වැටීම තහවුරු වීම පිණිස ලබින් මත මැටි ගෑම වඩාත් උචිත ය. ලබින් මඟින් වැසීම අපහසු නම් ලෑලි හෝ ගල්වලින් දේහයට පස් නොවැටෙන සේ වැසිය යුතු ය. ඉන් අනතුරු ව පස් දමා කබ්රය වසා දැමිය යුතු වේ. දේහය කබ්රහි තැන්පත් කරන අවස්ථාවේ දී මෙසේ පැවසීම මුස්තහබ් හෙවත් ප්‍රියජනක වේ. "බිස්මිල්ලාහ් ව අලා මිල්ලති රසූලිල්ලාහ්" (අල්ලාහ්ගේ නාමයෙන් හා දේව දූත මුහම්මද්තුමාණන්ගේ මඟ පෙන්වීමට අනුව වළලන්නෙමු).

කබ්රය වියතක් පමණ උසට තිබෙන පරිදි උස් කළ යුතු අතර, හැකි නම් කුඩා ගල් කැට ඒ මත තැබීම හා ජලය ඉසීම සුදුසු ය. ජනාසාවට සහභාගී වූ අය කබ්රය අසළ සිටගෙන මිය ගිය පුද්ගලයා වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම ආගමානුකූල කර්තව්‍යයකි. දේව දූත මුහම්මද්තුමාණෝ දේහය වැළලීමෙන් අනතුරු ව ඒ අසළට වී "ඔබලාගේ සහෝදරයා වෙනුවෙන් පාපක්ෂමාව අයඳින්න. (කබ්රයේ ප්‍රශ්න කිරීම්වල දී)

ස්ථිර ව සිටීමට ප්‍රාර්ථනා කරන්න. ඔහු මේ අවස්ථාවේ දී ප්‍රශ්න කරනු ලබමින් සිටී." යනුවෙන් පැවසූහ.

♦ නවවන කරුණ ලෙස: ජනාසා සලාතය ඉටු නො කළ උදවිය දේහය වැළලීමෙන් අනතුරු ව සලාතය ඉටු කිරීම සඳහන් කළ හැකි ය.

එසේ කිරීම ඉස්ලාමයේ අනුමත ය.

මන් ද යත් දේව දූත මුහම්මද්තුමාණෝ එසේ කර ඇත්තෝ ය. නමුත් එසේ කිරීම දේහය වළලා මසක් ගතවන තුරු පමණක් වලංගු වේ. ඊට වඩා වැඩි කාලයක් ගත වූයේ නම් එසේ සලාතය කිරීම නො කළ යුතු ය. මන් ද යත් දේව දූත මුහම්මද්තුමාණන් දේහය වැළලීමෙන් මසකට පසු එසේ සලාතය කළ බවට කිසිදු සඳහනක් නොමැති නිසා ය.

♦ දහවන කරුණ: මිය ගිය පුද්ගලයාගේ නිවසේ උදවිය ආහාර පිසීම අනුමත නො වේ.

ජරීර් ඉබ්නු අබ්දුල්ලාහ් අල්බජලියි නමැති සහාබිවරයා (දේව දූත මුහම්මද්තුමාණන්ගේ සහගාමියා) මෙසේ පවසයි. "දේහය වැළලීමෙන් පසු මිය ගිය පුද්ගලයාගේ නිවසට ගොස් එහි රැස්වීම හා ආහාර අනුභව කිරීම අන්නියාහා එනම් මහා හඬින් විලාප දෙමින් හඬා වැටීම යන කරුණට අන්තර්ගත වන්නක් යැයි අපි සැළකුවෙමු." ඉමාම් අහ්මද්තුමා මෙම

හදීසය හසන් (පිළිගත හැකි) ගණයට අයත් හදීසයක් ලෙස තම මුස්නද් අහ්මද් ග්‍රන්තයේ සඳහන් කරයි.

අන්නියාහා යනු ඉස්ලාමයේ තහනම් කරන ලද කරුණකි. මිය ගිය පුද්ගලයාගේ නිවසේ උදවිය හා අමුත්තන් වෙනුවෙන් ආහාර පිළියෙළ කිරීම මිය ගිය පුද්ගලයාගේ ඥාතීන්ටත් අසල්වැසියන්ටත් ආගමානුකූල කරුණක් වේ. මන් ද දේව දූත මුහම්මද්තුමාණන්ට ෂාම් දේශයේ මරණයට පත් ජඃෆර් බින් අබී තාලිබ්තුමාගේ මරණය පිළිබඳ පුවත ආරංචි වූ අවස්ථාවේ දී දේව දූත මුහම්මද්තුමාණෝ ජඃෆර්තුමාගේ පවුලේ උදවිය වෙනුවෙන් ආහාර පිළියෙළ කරන මෙන් තම පවුලට අණ කළහ. තව ද එතුමාණෝ මෙසේ ද ප්‍රකාශ කළහ. "ඔවුන් (මිය ගිය පුද්ගලයාගේ උදවිය) වෙත ඔවුන් කාර්යබහුල කරවන කරුණක් (මරණයක්) සිදු ව ඇත." මෙහි අදහස වන්නේ මිය ගිය පුද්ගලයාගේ නිවැසියන්ට තම පවුලේ මරණයක් සිදු ව ඇති නිසා ඒ සම්බන්ධ වැඩකටයුතුවල නිරත වීමට සිදු වන හෙයින් ආහාර පිළියෙළ කිරීමට තරම් කාලවේලාවක් හෝ මානසිකත්වයක් නොමැති නිසා එම ආහාර පිළියෙළ කිරීමේ කටයුත්ත වෙනත් කවරෙකු හෝ සිදු කළ යුතු යන්න ය.

♦ එකොළොස්වන කරුණ: ගැබිණියක හෝ ස්වාමියා අහිමි කාන්තාවකට හැර වෙනත් කිසිදු

කාන්තාවකට අල්ඉහ්දාද් ක්‍රමයට එනම් තම ශරීරය අලංකාර කරගැනීම, විවිධ වර්ණවලින් යුත් අලංකාර ඇඳුම් පැළඳුම්, ස්වර්ණාභරණ හා සුවඳ විලවුන්වලින් ඉවත් ව කල්ගෙවීම අනුමත නො වේ.

ස්වාමියා අහිමි කාන්තාව මාස හතරක් හා දවස් දහයක් දක්වා ද ගැබිණි කාන්තාව දරු ප්‍රසූතිය දක්වා ද ඉහත කී අල්ඉහ්දාද් ක්‍රමයට අනුව කල්ගත කළ යුතු ය.

පිරිමියෙකු නම් කිසිදු කෙනෙකුගේ මරණයක් වෙනුවෙන් එලෙස සිටීම අනුමත නො වේ.

♦ දොළොස්වන කරුණපිරිමින් හට විටින් විට කබ්ර් එනම් මිනී වළවල් වෙත යෑම, මිය ගිය උදවිය වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම, අල්ලාහ්ගේ කරුණාව හා ආශිර්වාදය ඔවුන් වෙත ලැබේවා! යැයි ප්‍රාර්ථනා කිරීම, මරණය හා ඉන් පසු මුහුණ දීමට සිදු වන දෑ පිළිබඳ සිහිපත් කරගැනීම ආගමානුකූල කරුණක් වේ.

නබිවරයාණෝ (එතුමා කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදාවේවා) මෙසේ පවසා ඇත්තෝ ය. "ඔබලා කබ්ර් එනම් මිනී වළවල් වෙත යන්න. සැබැවින් ම ඔබලාට එය පරලොව පිළබඳ සිහිපත් කර දෙනු ඇත." ඉමාම් මුස්ලිම්තුමා තම සහීහ් මුස්ලිම් ග්‍රන්තයේ මෙය සඳහන් කොට ඇත. දේව දූත මුහම්මද්තුමාණෝ තම සහගාමීන්ට කබ්ර් වෙත ගියේ

නම් මෙලෙස පවසන මෙන් ඉගැන්වූහ. "අස්සලාමු අලෛකුම් අහ්ලද්දියාරි මිනල් මුඃමිනියින වල්මුස්ලිමියින්, වඉන්නා ඉන්ෂා අල්ලාහ් බිකුම් ලාහිකූන්, නස්අලුල්ලාහ ලනා වලකුමුල් ආෆියාහ්, යර්හමුල්ලාහුල් මුතකද්දිමියින මින්නා වල්මුස්තඃහිරියින්." (විශ්වාසවන්තයින්ගෙන් හා මුස්ලිම්වරුන්ගෙන් යුත් නිවැසියනි! ඔබලාට ශාන්තිය හිමි වේවා! අපි ද ඉන්ෂා අල්ලාහ් ඔබත් සමග එක්වන්නෙමු. අපටත් ඔබලාටත් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතන්නෙමු. අප අතුරින් (මෙම කබ්රයට) පෙර පැමිණි අයටත් පසු ව පැමිණෙන අයටත් අල්ලාහ්ගේ කරුණාව හිමි වේවා!)

අපගේ දේව දූත මුහම්මද්තුමාණන්ටත් එතුමාගේ පවුලේ උදවියටත් එතුමාගේ සහගාමීන්ටත් අල්ලාහ් ඔහුගේ ශාන්තිය පහළ කරත්වා!

"ඔවුන් අල්ලාහ් කෙරෙහි ආදේශ තබන්නේ නම්....................9

"කුෆ්රයට එනම් ප්‍රතික්ෂේප කිරීමට සාක්ෂිකරුවන්................ 9

."සැබැවින් ම අල්ලාහ් තමන් කෙරෙහි ආදේශ තබන.............10

කවරෙකු අල්ලාහ් කෙරෙහි ආදේශ තබන්නේ ද....................10

ඔබලා කාන්තාවන් ඇසුරු කළේ නම්...................................25

නබිවදන් පටුන

ඔබලා කෙරෙහි මා බිය වන, ඉතා බියකරු ම....................... 10

කවරෙකු අල්ලාහ් හැර වෙනත් දෙයක් මත දිවුරන්නේ ද...... 11

"අල්ලාහ්ගේ අභිමතය හා යමෙකුගේ අභිමතය පරිදි............. 11

"දජ්ජාල්ටත් වඩා ඔබලා කෙරෙහි මා වැඩි වශයෙන්............. 12

"ඔවුන් (මිය ගිය පුද්ගලයාගේ උදවිය) වෙත ඔවුන්................40

පටුන

පෙරවදන 3

පළමු පාඩම 4

සූරා අල්-ෆාතිහා සහ කෙටි සූරා කිහිපයක් 4

දෙවන පාඩම 5

ඉස්ලාමයේ මූලිකාංග 5

තෙවන පාඩම 6

ඊමානයේ මූලිකාංග 6

සිව්වන පාඩම 7

තව්හීද්හි හා ෂිර්ක්හි කොටස් 7

පස්වන පාඩම 13

අල් ඉහ්සාන් 13

හයවන පාඩම 13

සලාතයේ කොන්දේසි 13

හත්වන පාඩම 14

සලාතයේ මූලිකාංග (අර්කාන්) 14

අටවන පාඩම 14

සලාතයේ අනිවාර්ය කරුණු (වාජිබාත්) 14

නවවන පාඩම 16

තෂහ්හුදය පිළිබඳ විස්තර 16

දහවන පාඩම 18
සලාතයේ සුන්නත් (වෛකල්පිත) දෑ................................... 18
එකළොස්වන පාඩම 21
සලාතය අවලංගු කරවන කරුණු.. 21
දොළොස්වන පාඩම 22
වුළූහ් කොන්දේසි.. 22
දහතුන්වන පාඩම... 23
වුළූහ් අනිවාර්ය කරුණු 23
දහහතරවන පාඩම.. 24
වුළූ අවලංගු වන කරුණු.. 24
පහළොස්වන පාඩම 25
සෑම මුස්ලිම්වරයෙකු සතු ව ම තිබිය යුතු යහ ගුණාංග 25
දහසයවන පාඩම... 26
ඉස්ලාමීය සිරිත් විරිත්... 26
දහහත්වන පාඩම 27
ෂිර්ක් කටයුතු හා පාපී කටයුතුවලින් වැලකී සිටින මෙන් අවවාද
කිරීම. 27
දහඅටවන පාඩම 28
මෘත දේහයක් වැළලීම සඳහා සූදානම් කිරීම, දේහය සඳහා
සලාතය හෙවත් නැමඳුම ඉටු කිරීම හා වැළලීම 28

تنشر الإسلام بأكثر من 100 لغة

موسوعة القرآن الكريم
QuranEnc.com
موسوعة تضم تفاسير وتراجم موثوقة لمعاني القرآن الكريم

موسوعة الأحاديث النبوية
HadeethEnc.com
موسوعة تضم ترجمات للأحاديث النبويـــة وشروحها بعدة لغـات

موسوعة المصطلحات الإسلامية
TerminologyEnc.com
موسوعة تضم ترجمات المصطلحات الإسلاميـــة وشروحها بعدة لغـــات

منتقى المحتوى الإسلامي
موسوعة تضم المنتقى من المحتوى الإسلامي باللغات

IslamHouse.com
مرجعيـة مجانيـة إلكترونية موثوقة للتعريف بالإسلام

جـمـعـيـة الـدعـوة وتوعية الجاليات بالربوة
Rabwah

جمعية خدمة المحتوى الإسلامي باللغات